**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය - 2021**

**-----------------------------------------------**

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර, 2016 දෙසැම්බර් 28 දින එළඹි අංක 5915-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ IIබී (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව

**--------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාව තුළ දුප්පත් හා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ප්‍රයෝජනය සඳහා සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල සමානාත්මතාව, කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 03 කින් සමන්විත වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 11,212.50කට සමාන එ.ජ.ඩො මිලියන 75ක් වන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2022 ජුනි 30 දින වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය නිමකිරීමේ දිනය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

**------**

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකිම

**----------------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට

වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ. මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති,රීති සහ රෙගුලාසි සමඟ අනුකූල නොවීම

| | නීති,රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතියේ ගනුදෙනු මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත්වී නොතිබුණි. | අප ලිපි දෙකක් මගින් අභ්‍යන්තර විගණන අංශය දැනටමත් දැනුවත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් හා මුදල් රෙගුලාසි සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව මෙහෙයුම් කමිටු රැස්වීම් මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී මෙහෙයුම් කමිටු රැස්වීම් 01ක් පමණක් පවත්වා තිබුණි. | රටෙහි පැවැති කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. අප හැකි විගස ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියකාරකම්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

විවිධ සමාජ සුභසාධන වැඩසටහන් මගින් සහය දක්වන පවුල් තෝරාගැනීම, කළමනාකරණය කිරීම සහ පද්ධතියෙන් ක්‍රමයෙන් ඉවත් කිරීම සඳහා කාර්යක්ෂම හා විනිවදභාවයෙන් යුතු ක්‍රමවේදයක් ස්ථාපන මගින් ශ්‍රී ලංකාවේ සාධාරණත්වය, කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුතු සමාජ ආරක්ෂණ වැඩසටහන් ස්ථාපනය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ලැබී තිබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය අවසානයේ දී පවුල් තෝරාගැනීම, කළමනාකරණය කිරීම සහ පද්ධතියෙන් ක්‍රමයෙන් ඉවත් කිරීම සඳහා කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමට නොහැකි වී තිබුණු අතර ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පැවතුණි. එමනිසා, මුළු ප්‍රතිපාදන මුදල වූ එ.ජ.ඩො. මිලියන 75න් 2019 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩො මිලියන 07ක් පමණ උපයෝජනය කර තිබුණි. පසුව කොවිඩ් වසංගත තත්ත්වය සලකමින් ශ්‍රී ලංකා රජය වසංගත තත්ත්වයට සහය ලබාදීමේ අරමුණින් ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කිරීමට ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කරන ලද අතර ඉතිරි ණය මුදලින් 2020 වර්ෂය තුළදී එකතුව රු. මිලියන 45ක් නිදහස් කර තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය රු. මිලියන 436.02ක් පොළී ගාස්තු සහ රු. මිලියන 107.54ක් බැඳීම් ගාස්තු ලෙස දැරීමට සිදු වී තිබුණි. ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**භෞතික කාර්ය සාධනය -සංරචක 1 සහ 2**

| | සංරචක | ක්‍රියාකාරකම් | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම සහ පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම | 2017 වර්ෂයේදී සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා තිබුණද එය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. මණ්ඩලයේ සභාපතිවරයා 2019 දෙසැම්බර් 06 දින සිය ධූරයෙන් ඉල්ලා අස්වී තිබුණු බව තවදුරටත් අනාවරණය වු අතර, නව සභාපතිවරයෙකු පත්කිරීමේ කටයුතු විගණිත දිනය වු 2020 මැයි 26 දින වනවිටත් සිදුකර නොතිබුණි. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර එය පූර්ණ ලෙස ක්‍රියාත්මක වේ. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සභාපතිවරයකු පත් කිරීමට සහ ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. |
| | | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ වැඩසටහන්වල ට ඇතුළත්වීම, අනුමත කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා | විගණිත දිනය වු 2022 මාර්තු 23 දින දක්වාම නව සුභසාධක ප්රතිලාභ යෝජනා ක්‍රමය සඳහා පාර්ලිමේන්තුවෙන් සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනවන විට සුභසාධක යෝජනා ක්‍රමයේ රෙගුලාසිවල කටයුතු නිමකර නොතිබුණි. එමනිසා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති නීති | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළ ගැසට් නිවේදනය අනුමත කිරීම සඳහා අදාළ පාර්ශවයන් වෙත බලපෑම් කිරීමට පියවර ගත යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ඉන් ඉවත්වීම සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිපත්තියක් සකස් කිරීම | තිබුණි. | කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය සමඟ රෙගුලාසි පාර්ලිමේන්තුව වෙත නැවත ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පත්කිරීමට පෙර රෙගුලාසි ඉදිරිපත් කරනු ලැබේ. | |
| | | සමාජ ආරක්ෂණ තොරතුරු ගබඩාවක් ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ඉතිරි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දත්තවල නිවැරදිතාව පිළිබඳ කටයුතු නිම කිරීම පිළිබඳ අවිනිශ්චිත වේ. | 2017 වර්ෂයේ පැවති තත්ත්වය සලකමින් සමාජ ආරක්ෂණ තොරතුරු ගබඩාවක් සංවර්ධනය කර තිබුණු අතර ඇගයීම් ලියවිලිවලට අනුව අඩු ආදායම්ලාභීන් කාණ්ඩ ඉලක්ක කර ගනිමින් ප්‍රධාන වැඩසටහන් 4ක් ආවරණය කිරීමට තීරණය කර තිබුණි. | වර්තමානයේ රටෙහි ක්‍රියාත්මක සියලුම සුභසාධක වැඩසටහන් වෙත අවධානය යොමුකිරීමට කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතිය | සුදුසුකම් සම්බන්ධයෙන් වූ නිර්ණායක පදනම් කරගෙන සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම | නිර්ණායක පදනම් කරගත් තෝරාගැනීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නොතිබුණි. | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනවන විට සුභසාධක යෝජනා ක්‍රමයේ රෙගුලාසිවල කටයුතු නිමකර නොතිබුණි. එමනිසා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය සමඟ රෙගුලාසි පාර්ලිමේන්තුව වෙත නැවත ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පත්කිරීමට පෙර රෙගුලාසි ඉදිරිපත් කරනු ලැබේ. | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළ ගැසට් නිවේදනය අනුමත කිරීම සඳහා අදාළ පාර්ශවයන් වෙත බලපෑම් කිරීමට පියවර ගත යුතු වේ. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය - සංරචක 03

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ලැබී තිබුණු තොරතුරුවලට අනුව පවත්නා සමාජ ආරක්ෂණ උපායමාර්ග පිළිබඳ සවිස්තරාත්මක ඇගයීමක් සිදුකිරීමට සහ ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 14.1 කට කොන්ත්‍රාත්තුවක් 2019 ජනවාරි 22 දින උපදේශන සේවා සමාගමක් වෙත පවරා තිබුණු අතර එය 2019 සැප්තැම්බර් 01 දින වනවිට අවසන් කිරීමට නියමිත විය. ලැබී තිබුණු තොරතුරුවලට අනුව, විගණිත දිනය වූ 2022 මාර්තු 23 දින දක්වාම අදාළ වැඩ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එකතුව රු. මිලියන 5.64ක් ගෙවා තිබුණි. | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මෙම කටයුත්තේ ඇති හිඩැස් හඳුනාගෙන තිබීම සහ වසංගත තත්ත්වය තුළදී ක්ෂේත්‍ර දත්ත ක්‍රියාවලිය මුහුණ දෙන ලද ගැටලු හේතුවෙන් අවසන් තක්සේරු වාර්තාව නිම කිරීමේ ප්‍රමාදයන් සිදුවිය. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පියවර ගත යුතු වන අතර ක්‍රියාකාරකම් කඩිනම් කළ යුතුය. |
| (ආ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන සවිබලගැන්වීමේ වැඩසටහන් මගින් පද්ධතියෙන් ක්‍රමයෙන් ඉවත් කිරීමේ උපාය මාර්ග සංවර්ධන වෙනුවෙන් වන කොන්ත්‍රාත්තුව තනි පුද්ගල උපදේශකවරයෙකු වෙත ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2.4කට 2020 ජුලි 20 දින පිරිනමා තිබුණු අතර 2021 ජුලි 31 දින වන විට නිම කිරීමට අපේක්ෂිත විය. ලැබී තිබුණු තොරතුරු අනුව, 2022 මාර්තු 23 විගණිත දින වන විටත් අදාළ කටයුතු නිමකර නොතිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.මිලියන 1.2ක් ගෙවා තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා සමහර ක්ෂේත්‍ර සමීක්ෂණය කිරීමට අපහසු වීම හේතුවෙන් ප්‍රමාදයන් සිදුවිය. ක්‍රමයෙන් ඉවත් කිරීමේ උපාය මාර්ග වාර්තාව මේ වන විට ඉදිරිපත් කර ඇති අතර අවසාන අදියරේ ඇගයීම් ගෙවීම අනුමැතිය පිළිබඳ නිර්දේශය දෙනු ලැබේ. | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූල වීමට උපදේශකවරයා පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |